යම් පුවතකට සෘජුවම අදාළ නොවන්නේ නම් පුද්ගලයෙකුගේ හෝ පුද්ගල කණ්ඩායමකගේ වාර්ගිකත්වය පුවත සමගින් සඳහන් නොකළ යුතු බව දෙස් විදෙස් මාධ්‍ය ආචාර ධර්ම තුළ සඳහන් වේ. මෙවැනි ආචාර ධර්මයක අවශ්‍යතාවය වන්නේ, යම් වාර්ගිකත්වයන් සම්බන්ධ කොට ගනිමින් ඒකාකෘතික කිරීම් ඇතිවීම වැළැක්වීම උදෙසායි.
නමුත් ඇතැම් මාධ්‍ය මෙම ආචාර ධර්මය උල්ලංඝනය කරන අවස්ථාවන් තිබේ. දිවයින (06/27) සහ ඉරිදා මව්බිම (06/27) පුවත්පත් තුළ පළව තිබූ ලිපි දෙකක, අත්අඩංගුවට ගත් සැකකරුවන්ගේ වාර්ගිකත්වයන් ද්‍රවිඩ/දමිළ ලෙසින් සඳහන්ව තිබිණි.
කෙසේ නමුත්, මෙම පුවතම වාර්තා කරනා ඉරිදා ලංකාදීප (06/27) පුවත්පතේ එම සැකකරුවන්ගේ වාර්ගිකත්වය සඳහන්ව නොතිබුණි.
මෙසේ ගත් විට, මෙම සැකකරුවන්ගේ වාර්ගිකත්වය මෙම පුවතට අදාළ වන්නේ කෙසේද? එම වාර්ගිකත්වය අදාළ නොවන අවස්ථාවක සඳහන් කිරීම ඔස්සේ දිවයින සහ ඉරිදා මව්බිම මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනය කර තිබෙනවා නොවේද?
#MediaEthicsSL #lka #SinhalaNews #SundayLankadeepa #SundayDivaina #SundayMawbima